VERITÉ RESEARCH
Strategic Analysis for Asia

165/1, PARK ROAD, COLOMBO 00500, SRI LANKA
TEL & FAX: + 94 11 2055544
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

**මාධ්‍ය නිවේදනය**

**විනිවිදභාවය අතින් EPF එක ලැයිස්තුගත සමාගම් සහ බැංකුවලට වඩා පසුපසින්: වෙරිටේ රිසර්ච් කියයි**

2026 මැයි මස 24 වෙනිදා, කොළඹදී ය.

සේවක අර්ථසාධක අරමුදල (EPF) ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය වුවද, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ඒකක භාර (unit trusts) වැනි තෙවැනි පාර්ශවයන් වෙනුවෙන් අරමුදල් කළමනාකරණය කරන අනෙකුත් ආයතනවලට සාපේක්ෂව එහි විනිවිදභාව සහ තොරතුරු අනාවරණය කිරීම පවතින්නේ අඩු මට්ටමක වේ..

වෙරිටේ රිසර්ච් ආයතනය විසින් අද (24) දින ප්‍රකාශයට පත් කරන ලද 'ශ්‍රී ලංකාවේ සේවක අර්ථසාධක අරමුදල: තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රමාණවත්භාවය පිළිබඳ සංසන්දනාත්මක තක්සේරුවක්' (The Employment Provident Fund in Sri Lanka: A Comparative Assessment of the Adequacy of Information Disclosure) නම් නව පර්යේෂණ වාර්තාව මඟින් මේ බව අනාවරණය කර ඇත.

පොදු ජනතාවගේ ඉතුරුම් තැන්පතු පාලනය කරනු ලබන අනෙකුත් ආයතනවලට වඩා, සේවක අර්ථසාධක අරමුදල අඩු තොරතුරු ප්‍රමාණයක්, අඩු විස්තර සහිතව, අඩු වාර ගණනක් සහ ප්‍රමාද වී අනාවරණය කරන බව මෙම වාර්තාවෙන් සොයාගෙන ඇත. සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), තමන් විසින් නියාමනය කරනු ලබන අනෙකුත් මූල්‍ය ආයතනවලට අදාළ කරන විනිවිදභාවයේ ප්‍රමිතීන්ට වඩා අඩු ප්‍රමිතියක් සේවක අර්ථසාධක අරමුදල සඳහා අනුගමනය කරන බව මෙයින් ඇඟවේ..

එසේම, OECD හි විශ්‍රාම වැටුප් අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංවිධානයේ (IOPS) මූලධර්ම සහ 'ගෝලීය විශ්‍රාම වැටුප් විනිවිදභාවයේ නිර්ණායක' (GPTB) මඟින් දක්වා ඇති, අරමුදල් තොරතුරු කාලීනව, සවිස්තරාත්මකව සහ ප්‍රවේශ විය හැකි පරිදි පොදුවේ අනාවරණය කිරීමේ ජාත්‍යන්තර මිණුම්දඬු සපුරාලීමට ද සේවක අර්ථසාධක අරමුදල අපොහොසත් වී ඇත.

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් මුහුණ දෙන සුවිශේෂී තත්ත්වය හේතුවෙන් මෙම අඩුපාඩු ඉතා බරපතළ වේ. පුද්ගලික අංශයේ සේවකයන් නීතියෙන්ම සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, අරමුදලේ කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුන්ට කිසිදු භූමිකාවක් නොමැත, එමෙන්ම තමන්ගේ ඉතුරුම් කැමති පරිදි ආපසු ලබා ගැනීමට ද ඔවුන්ට නොහැකිය. එබැවින්, ගෝලීය විනිවිදභාවයේ ප්‍රමිතීන්ට අනුකූල වීම යනු සාමාජිකයන්ගේ අනාගත සුභසාධනය ආරක්ෂා වී ඇති බව සහතික කර ගැනීමට ඔවුන් සතු එකම ආරක්ෂාවයි. 2019 වසරේ ප්‍රකාශයට පත් කරන ලද වෝහාරික විගණනවලින් (forensic audits) මඟින් හෙළිදරව් වූ පරිදි, සේවක අර්ථසාධක අරමුදල මීට පෙර මූල්‍ය වංචාවලට ගොදුරු වී තිබීමත් මෙම තත්ත්වය තවත් බරපතල කරයි.

මෙම අසාර්ථකත්වයන් මඟහරවා ගැනීම සඳහා කෙටි හා මධ්‍යකාලීන ප්‍රතිසංස්කරණ තුනක් මෙම පර්යේෂණ වාර්තාව මඟින් හඳුනාගෙන ඇත. පළමුවැන්න සේවක අර්ථසාධක අරමුදල් පනතට පූර්ණ ලෙස අනුකූල වීම සහතික කිරීමයි, ජාත්‍යන්තර හොඳම භාවිතයන් අනුගමනය ගැනීම දෙවැන්න වන අතර, තෙවැන්න සේවක අර්ථසාධක අරමුදල් තොරතුරු අනාවරණය කිරීම පිළිබඳ 2024 පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්මත කිරීම වේ. සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සහ අරමුදලේ

අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා වඩාත් ශක්තිමත් නියාමනයක අවශ්‍යතාවය එහි දිගුකාලීන ප්‍රතිසංස්කරණවලට අත්‍යාවශ්‍යම වේ.

වෙරිටේ රිසර්ච් ආයතනයේ සම්පූර්ණ පර්යේෂණ වාර්තාව වෙත මෙතැනින් පිවිසිය හැකිය:

[The Employment Provident Fund in Sri Lanka: A Comparative Assessment of the Adequacy of Information Disclosure]

**තොරතුරු අනාවරණය කිරීමේ පරිචයන් පිළිබඳ සාරාංශගත සංසන්දනය**

| අනාවරණය කරන ආයතනය/ප්‍රමිතිය | තොරතුරුවල ප්‍රමාණවත්භාවය සහ සවිස්තරාත්මකභාවය | අනාවරණය කිරීමේ කාලීනභාවය සහ වාර ගණන |
|---|---|---|
| **සේවක අර්ථසාධක අරමුදල (EPF)** | ඉතා ඉහළින් සමස්තගත කළ සහ මූලික සැකිල්ලකට පමණක් සීමා වූ වාර්තාකරණයක්. ආයෝජන මට්ටමේ දත්ත, වත්කම් පන්ති ප්‍රතිලාභ, මිණුම් ලකුණු, අවදානම් මිමි, පිරිවැය වෙන් කිරීම් සහ පාලනය පිළිබඳ අනාවරණයන් මඟ හරියි. සෑම ආයෝජනයක්ම වෙන වෙනම අනාවරණය කළ යුතු බවට වන ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුකූල නොවේ. | වාර්ෂිකව පමණක් සිදු කරන අනාවරණයන් වන අතර, ඒවාද අඛණ්ඩ ප්‍රමාදයන් සහිතය. නිරන්තරයෙන් ව්‍යවස්ථාපිත කාලසීමාවන් මඟ හැරේ; ප්‍රකාශයට පත් කරන ලද වාර්තා අතර වසර පහක් දක්වා වූ ඓතිහාසික පරතරයන් පවතී. අර්ථවත් අතුරු කාර්ය සාධන වාර්තාකරණයක් නොමැත. |
| **ඒකක භාර (ශ්‍රී ලංකාව)** | ගාස්තු, ඓතිහාසික ප්‍රතිලාභ (වසර පහක් දක්වා), වත්කම් පන්ති වෙන් කිරීම් සහ ආයෝජන කළඹෙහි ලක්ෂණ ඇතුළත් සවිස්තරාත්මක අරමුදල් මට්ටමේ වාර්තාකරණයක්. බොහෝ සමාගම් විසින් අංශ අනුව සහ ණය ශ්‍රේණිගත කිරීම් අනුව වෙන් කිරීම් සහ වෙනත් මූල්‍ය කාර්ය සාධන අනුපාත ඇතුළත් අතිරේක ස්වේච්ඡා කරුණු පත්‍රිකා සපයනු ලැබේ. | මාසිකව කාර්ය සාධනය සහ අරමුදලේ ප්‍රමාණය අනාවරණය කිරීම; සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) නීතිරීති මඟින් අවශ්‍ය කර ඇති පරිදි දෛනිකව ශුද්ධ වත්කම් අගය ප්‍රකාශයට පත් කිරීම. |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ශ්‍රී ලංකාව)** | බාහිර සහතික කිරීම් මඟින් අනුබල ලත්, පාලනය, අවදානම් නිරාවරණයන්, විශාලතම ප්‍රතිපාර්ශ්වකරුවන්, නියාමන උල්ලංඝනය කිරීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ආවරණය වන පරිදි පුළුල් සහ සවිස්තරාත්මක අනාවරණයන්. | මහ බැංකුව සහ කොළඹ කොටස් හුවමාරුව මඟින් බලාත්මක කරන දැඩි නියාමන කාලසීමාවන්ට යටත්ව, ත්‍රෛමාසික සහ වාර්ෂික මූල්‍ය වාර්තාකරණය සිදු කිරීම. |
| **කොළඹ කොටස් හුවමාරුව** | ලැයිස්තුගත කිරීමේ නීති සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන, ඛණ්ඩක තොරතුරු, පාලන අනාවරණයන් සහ අවදානම් | අනිවාර්ය ත්‍රෛමාසික සහ වාර්ෂික වාර්තාකරණය. වාර්තා ගොනු කිරීම ප්‍රමාද වීම මඟින්, නිර්වචනය |

| | | |
|---|---|---|
| **(ලැයිස්තුගත සමාගම්)** | වාර්තාකරණය සහිත ප්‍රමිතිගත මූල්‍ය ප්‍රකාශන. | කරන ලද කාලසීමාවන් තුළ ක්‍රමානුකූලව පියවර ගැනීම් (නිරීක්ෂණ ලැයිස්තුවට ඇතුළත් කිරීම, අත්හිටුවීම, ලැයිස්තුවෙන් ඉවත් කිරීම) ප්‍රේරණය වේ. |
| **ජාත්‍යන්තර විශිෂ්ට පරිචය (GPTB)** | වත්කම් පන්ති ප්‍රතිලාභ, මිණුම් ලකුණු, පිරිවැය, පාලනය, පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අනුකලනය සහ ආයෝජන මට්ටමේ විනිවිදභාවය ආවරණය වන පරිදි සවිස්තරාත්මක, වෙන් කරන ලද අනාවරණයන්. | මූලික විනිවිදභාවයේ අවශ්‍යතාවයක් ලෙස කාලෝචිත ලෙස ප්‍රකාශයට පත් කිරීම සමඟ, මාසික හෝ ත්‍රෛමාසික කාර්ය සාධන වාර්තාකරණය. |